# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 14,921/5 — 1970 සැප්තැම්බර් 3 වැනි බ්‍රහස්පතින්ද — 1970.9.3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

එල්.ඩී.—බී. 29/56.

**සුළු නගර සභා ආඥපනත**

**183 වැනි වගන්තිය යටතේ ආඥව**

1968 අංක 42 දරන පනතින් සංශෝධිත (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 183 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති පිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, පිළියන්දල සුළු නගර සභාව විසින්—

(අ) රැස්වීම් පැවැත්වීම අත්නැරම ප්‍රතික්ෂෙප කිරීම, සහ

(ආ) එකී ආඥපනතින් පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම චුවමනාවෙන්ම පැහැර හැරීම.

යන මේවා ඔප්පු වන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට සෑහීමට පත්ව, මෙම ආඥවෙන්—

(අ) පිළියන්දල සුළු නගර සභාව විසුරුවා හරිමි, තවද

(ආ) ඒ නගරය සඳහා එකී ආඥපනත යටතේ අළුත් සුළු නගර සභාවක් සංස්ථාපනය කර ගන්නා තුරු පිළියන්දල නගරයේ කටයුතු පාලනය කිරීම පිණිස ද, ඒ කාර්යය සඳහා එකී ආඥපනත යටතේ සුළු නගර සභාවක බලතල ක්‍රියාවේ යෙදවීම සහ යුතුකම් ඉටුකිරීම පිණිස ද විශෙෂ කොමසාරිස්වරයා වශයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් ඔලිවර් ගුරුසිංහ මහතා පත් කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති.

1970 සැප්තැම්බර් මස 3 වෙනි දින,
කොළඹ දී ය.

9–416


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

602/3——ජේ 16573—5,500 (70/9)